සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව / தென் மாகாணக் கல்வித் திணைக்களம்**
**DEPARTMENT OF EDUCATION-SOUTHERN PROVINCE**
**අවසාන වාර පරීක්ෂණය - 2021 (2022 මාර්තු)**

| 9 ශ්‍රේණිය | නර්තනය | කාලය පැය 2 |
|---|---|---|

නම / විභාග අංකය ..................................................................................................................

# I කොටස

**ප්‍රශ්න අංක 01 - 10 තෙක් ප්‍රශ්න වලට ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(1) ගොඩ සරඹ/ඉලගම් සරඹ නටා අවසානයේ නටනු ලබයි.

(1) ඉරට්ටිය හා හමාර පදයි (2) කලාසම හා හමාර පදය
(3) කස්තිරම හා ඉරට්ටිය (4) ඉරට්ටිය හා හමාර පදය

(2) මාත්‍රා 3+4 දෙනිතට අයත් බෙරපදය වන්නේ,

(1) දොං දොං ජිං ගජිතග / රුදකිට තත්දොම්
(2) දෝං ජිං ජිං තකට දොංතක / ගුංද ගතිගත ගත්ත ගුඳිගුද
(3) දොදොංත තකු දොං / රුද කිට තත්දොම්
(4) දොං ජිංත ගත දොංත / ගුංද දෙගත ගතිගත ගුද

(3) ත්‍රිවිධ ලය පිළිවෙලින් මෙසේය,

(1) විලම්භ, මධ්‍ය, ද්‍රැත (2) මධ්‍ය, විලම්භ, ද්‍රැත
(3) ද්‍රැත, විලම්භ, මධ්‍ය (4) මධ්‍ය, ද්‍රැත, විලම්භ

(4) වෘත්තීන් හා බැඳි ගැමි නැටුම් සඳහා භාවිතා වන කවි වන්නේ,

(1) පතුරු කවි, සවරං කවි (2) පන්තේරු කවි, තාලම් කවි
(3) ග්‍රහපංති කවි, තාලම් කවි (4) පන්නෙලීම් කවි, ගොයම් කවි

(5) නර්තනයක් නිර්මාණය කිරීමේදී භාවිතා කල හැකි චලන වර්ග තුනකි.

(1) තාලානුකූල චලන, අභිචලන, ප්‍රකාශනාත්මක චලන
(2) තාලානුකූල චලන, ප්‍රකාශනාත්මක චලන, රිද්මයානුකූල චලන.
(3) සංචලන, අභිචලන, ප්‍රකාශනාත්මක චලන
(4) රිද්මයානුකූල චලන, අභිචලන, ප්‍රකාශනාත්මක චලන

(6) "සිරිවස ගෙන අසු - නැගෙමින් නොලසා.................."

(1) චාමර කවියකි (2) ග්‍රහ පංති කවියකි
(3) තාලම් කවියකි (4) සවරං කවියකි

(7) ' ශෝකය' නැමැති ස්ථායි භාවය තුලින් ...................... උපදී.

(1) හාස්‍ය රසය (2) කරුණා රසය

(3) වීර රසය (3) අද්භූත රසය

(8) බෙර වාදනයට දෑත හුරුකර ගැනීම සඳහා මුලින්ම ...................................... වාදනය කල යුතුය.

(1) බෙර පද (2) අලංකාර පද

(3) සතර බීජාක්ෂර (4) ගර්භාක්ෂර

(9) තනිතිතේ තාල රූපයක තිබිය හැකි අඩුම මාත්‍රා ගණන සහ වැඩිම මාත්‍රා ගණන,

(1) 3 සහ 4 කි (2) 1 සහ 3 කි

(3) 2 සහ 3 කි (4) 2 සහ 4 කි

(10) යුධ කටයුතුවලදී සෙබළුන්ගේ චිත්ත ධෛර්ය ඇති කිරීම සඳහා වාදනය කරනු ලබන්නේ,

(1) රණ බෙර (2) අණබෙර (3) වද බෙර (4) පිංබෙර

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති ප්‍රකාශය හරිනම් (✓) ලකුණද වැරදිනම් (✗) ලකුණද යොදන්න.**

(11) සමූහ වාදනයේදී සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ මෙන්ම විකල්ප වාද්‍ය භාණ්ඩද යොදාගනී. ( )

(12) මණ්ඩිපද නටනු ලබන්නේ පහතරට නර්තන සම්ප්‍රදායේ දීය. ( )

(13) කරදිය මුද්‍රා නාට්‍ය චිත්‍රසේන ඩයස් මහතාගේ නිර්මාණයකි. ( )

(14) දෙවොල්මඩු ශාන්තිකර්මයේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය දවුල වේ. ( )

(15) අංග, ප්‍රත්‍යාංග, උපාංග මඟින් අදහස් ප්‍රකාශ කිරීම ආංගික අභිනයයි. ( )

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු පහත දී ඇති වගුව ඇසුරින් සපයන්න.**

| | A | B | C | D | E |
|---|---|---|---|---|---|
| 1 | මැටි | තාලම්පට | රත්නපුර | සෙල්ලිපි | ගාල්ල |
| 2 | ධීවර | මහනුවර | රණබෙර | සංදේශ කාව්‍ය | මාතර |
| 3 | පතල් | අත්‍යාබෙර | දවුල | කුරුවිට | තංගල්ල |
| 4 | පන් | මගුල් බෙර | අඹ විදමන | අණ බෙර | හම්බන්තොට |

(16) ගායනා වලදී භාවිතා කරන ඝන වර්ගයට අයත් තාල වාද්‍ය භාණ්ඩය දක්වා ඇත්තේ

(1) C තීරුවේ 3 වන පේළිය

(2) B තීරුවේ 3 වන පේළිය

(3) D තීරුවේ 4 වන පේළිය

(4) B තීරුවේ 1 වන පේළිය

(17) ශ්‍රී ලංකාවේ නර්තන කලාව හා සම්බන්ධ තොරතුරු ලබාගත හැකි මූලාශ්‍ර දක්නට ඇත්තේ,

(1) C තීරුවේ 4 වන සහ 1 වන පේළියේය

(2) D තීරුවේ 2 වන සහ 3 වන පේළියේය

(3) D තීරුවේ 1 වන සහ 2 වන පේළියේය

(4) C තීරුවේ 4 වන සහ 2 වන පේළියේය

(18) ශ්‍රී ලාංකීය ජනයාගේ ජීවන වෘත්තීන් දක්වා ඇත්තේ,

(1) A සහ B තීරුවේ | (2) B තීරුවේ

(3) A සහ D තීරුවේ | (4) A තීරුවේ

(19) සන්නිවේදන කටයුතු සඳහා අතීතයේදී වාදනය කරන ලද වාද්‍ය විශේෂය දැක්වෙන්නේ,

(1) D තීරුවේ 4 වන පේළියේ

(2) B තීරුවේ 3 වන පේළියේ

(3) C තීරුවේ 2 වන පේළියේ

(4) C තීරුවේ 3 වන පේළියේ

(20) පහතරට නර්තන සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශ දැක්වෙන්නේ,

(1) C තීරුවේ 1 වන පේළියේය

(2) E තීරුවේය

(3) B තීරුවේ 1 වන පේළියේය

(4) D තීරුවේය

# II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

(1) i නර්තනයේ මූලික ඉරියව්ව ..................................................... වේ.

ii යම්කිසි පද කොටසක් හෝ ගායනයක් ප්‍රායෝගිකව භාවිතා කරන ආකාරය ලියා දැක්වීම ........................ යනුවෙන් හැඳින්වේ.

iii ශාන්තිකර්ම වල සැරසිලි සඳහා ............................. සහ ........................................... ආදී අමුද්‍රව්‍ය භාවිතා කරයි.

iv තම්මැට්ටම වාදනය කිරීම සඳහා ................................................ යොදාගනී.

v චරිත නිරූපනයේදී මිනිස් චරිත සහ ............................. චරිත ලෙස කොටස් දෙකකට බෙදිය හැකිය.

vi .ගැටබෙරයේ දකුණු ඇස ආරක්ෂා කිරීම සඳහා ....................................... භාවිතා කරයි.

vii ''අක්කෙ අක්කෙ අර බලන්නකෝ .............'' යන ගීතයේ පද රචනය ................................. මහතාය.

vii ශාරීරික ස්වස්ථතාව පවත්වාගැනීම සඳහා ........................................ කලාවෙන් මනා පිටිවහලක් ලැබේ.

ix ආතත සහ විතතාතත වර්ගයට අයත් වාද්‍ය භාණ්ඩ දෙකකි.

i. ආතත : ................................ ii. විතතාතත : ...........................

x පහත සඳහන් ශිල්පීන් සුවිශේෂී දක්ෂතා දැක්වූ නර්තන සම්ප්‍රදායන් ලියන්න.

i. විල්සන් ඔලබොඩුව මහතා ........................................

ii. අරනෝලිස් ඉඹුල්ගොඩ මහතා .................................

(2) i මාත්‍රා 3+4 දෙතිතට අයත් බෙර පදයක් / දවුල් පදයක් ලියන්න.

ii මාත්‍රා 3+3 තනිතිතට අයත් වන්නමක බෙරපදය/දවුල් පදය සහ කස්තිරම/ ඉරට්ටිය/ කලාසම ලියන්න.

iii මාත්‍රා 3+3 තාලරූපයට අයත් කවියක් ප්‍රස්තාර කරන්න.

(3) නර්තන කලාව හා සම්බන්ධ තොරතුරු සොයාගත හැකි මූලාශ්‍ර ලෙස සෙල්ලිපි හා සංදේශ කාව්‍ය දැක්විය හැකිය.

i නර්තන කලාව හා සම්බන්ධ තොරතුරු ඇතුලත් සෙල්ලිපි දෙකක් හා සංදේශ කාව්‍ය දෙකක් ලියන්න.

ii එක් සෙල්ලිපියක අන්තර්ගත සාධකයක් ලියන්න.

iii නළඟන රැගුම් පිළිබඳ විස්තර කෙරෙන සංදේශ කාව්‍යයක් නම් කර එහි එන කවියක් ලියන්න.

(4) ගැට බෙරය උඩරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩයයි.

i ගැටබෙරය වාදනය කරන අවස්ථා 03 ක් ලියන්න.

ii ගැටබෙරය සකස් කිරීම සඳහා යොදාගනු ලබන අමු ද්‍රව්‍ය 03 ක් ලියන්න.

iii ගැට බෙරයේ රූප සටහනක් ඇඳ කොටස් 04 ක් නම් කරන්න.

(5) i දේශීය නර්තන සම්ප්‍රදායන් තුන නම්කර ඒවාට අදාළ ප්‍රධාන ශාන්තිකර්ම ලියන්න.

ii එම ශාන්තිකර්ම තුනෙහි ඇතුළත් නර්තන අංග දෙක බැගින් ලියන්න.

iii ශාන්තිකර්ම පැවැත්වීමේදී සාමුහිකව කටයුතු කිරීමේ වැදගත්කම පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

(6) **i** ගැමි නැටුම් වල දැකිය හැකි ලක්ෂණ හතරක් නම් කරන්න.

ii කාන්තාවන් සඳහා වඩාත් උචිත ගැමි නැටුම් දෙකක් නම්කර ඉන් එක් ගැමි නැටුමකට අදාළ කවියක් ලියන්න.

iii ගැමි නැටුමක් සඳහා උචිත රංගවස්ත්‍රාභරණ කට්ටලයක් සකස් කර ගන්නා ආකාරය විස්තර කරන්න.

(7) i කථක් නර්තන සම්ප්‍රදාය ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| | | |
|---|---|---|
| ප්‍රචලිත ප්‍රදේශ | 1. .................................................... | 2. .................................................... |
| වාද්‍ය භාණ්ඩ | 1. .................................................... | 2. .................................................... |
| අධ්‍යාපන ආයතන | 1. .................................................... | 2. .................................................... |
| නර්තන අංග | 1. .................................................... | 2. .................................................... |

ii කතක් නර්තන සම්ප්‍රදායේ රංග වස්ත්‍රාභරණ පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව / தென் மாகாணக் கல்வித் திணைக்களம்
**DEPARTMENT OF EDUCATION-SOUTHERN PROVINCE**
**අවසාන වාර පරීක්ෂණය - 2021 (2022 මාර්තු)**

9 ශ්‍රේණිය | පිළිතුරු පත්‍රය හා ලකුණු දීමේ පටිපාටිය | කාලය පැය 2

## I පත්‍රය

| | | | | |
|---|---|---|---|---|
| 1) 3 | 2) 2 | 3) 1 | 4) 4 | 5) 2 |
| 6) 2 | 7) 2 | 8) 3 | 9) 4 | 10) 1 |
| 11) ✔ | 12) ✖ | 13) ✔ | 14) ✖ | 15) ✔ |
| 16) 4 | 17) 3 | 18) 4 | 19) 1 | 20) 2 |

ලකුණු = 2x20 = 40

## II පත්‍රය

(1) i මණ්ඩිය

ii ප්‍රස්තාරකරණය

iii ගොප්කොළ, කෙසෙල්බඩ, පොල්මල්, පුවක්මල්, හබරල කොළ

iv කඩිප්පුව

v සත්ත්ව

vi සුරත්තට්ටුව

vii ආනන්ද සමරකෝන් මහතා

viii නර්තනය

ix ආතත : ගැටබෙරය, පහතරට බෙරය, රබාන.............

විතතාත : තම්මැට්ටම, දඬු බෙරය...............

x විල්සන් ඔලබොඩුව මහතා :- පහතරට සම්ප්‍රදාය

අරනෝලිස් ඉඹුල්ගොඩ මහතා :- උඩරට සම්ප්‍රදාය

(2) i උඩරට/ පහතරට/ සබරගමු සම්ප්‍රදායට අදාළ 3+4 තාල රූපයට අයත් බෙරපදයක් නිවැරදිව ලිවීම

ලකුණු = 02

ii ඉගෙන ගන්නා සම්ප්‍රදායට අදාල

බෙර පදයක්/දවුල් පදයක් ලිවීම = ලකුණු = 02

කස්තිරම/ ඉරට්ටිය/කලාසම ලිවීම. ලකුණු = 03

iii වගුව ඇඳ විභාගකර දක්වීම හා සංකේත යෙදීම ලකුණු = 02

කවිය නිවැරදිව ප්‍රස්තාර කිරීම ලකුණු = 03

(3) i සෙල්ලිපි ඃ- සැස්සේරුව සෙල්ලිපිය, කොරවක්ගල සෙල්ලිපිය,
කාලිංගවනයේ ගල් ආසන සෙල්ලිපිය
පාල මොට්ටායි සෙල්ලිපිය

සංදේශ කාව්‍යඃ- තිසර සංදේශය, පරවි සංදේශය, සැළලිහිණි සංදේශය ලකුණු = 04

ii සැස්සේරුව සෙල්ලිපිය ඃ-

''නටන ගහපතියා'' විසින් පවරා දෙන ලදි

කොරවක්ගල සෙල්ලිපිය ඃ-

"නටන ගහපතියාගේ දුව විසින් පවරා දෙන ලදී"

කාලිංග වනයේ ගල් ආසන සෙල්ලිපිය ඃ-

"කාලිංග වනයෙහි නෘත්‍ය ගීත බලා වැඩ හිඳිනා සිංහාසනයයි''

පාලමොට්ටායි සෙල්ලිපිය ඃ-

දේවදාසීන් සිටි බවත් ඔවුන් නැටූ බවත්, ලංකාව සොළින්ට යටත් වූ පසුව දෙවියන් උදෙසා පූජා නැටුම් පැවැත් වූ බවත් පෙනේ. නළලෙහි සලකුණු තබා දේව දාසින් හත් දෙනෙකු පිදූ බවත් ඔවුන්ට තැන්පත් මුදලක පොළියෙන් කාසි ගෙවූ බවත් කියවේ.

ලකුණු = 04

iii සැළලිහිණි සංදේශය ඃ-
විදෙන ලෙලෙන නරුබර පුළුලුකුල රැදී .................................
පරවි සංදේශය ඃ- ලෙළදුන් නව තඹ පලුවන් පාදේ .....................
(කවිය සම්පූර්ණයෙන් ලිවිය යුතුය) ලකුණු = 04

(4) i පිරිත් පිංකම්, පෙරහැර, තේවාවාදන අවස්ථා
ශාන්තිකර්ම, විවිධ උත්සව, තූර්ය වාදන අවස්ථා ලකුණු = 03
ii ඇහැළ, කොහොඹ, ගංසූරිය, කොස් (දැව වර්ග)
හරක් හම්, මුවහම්, වඳුරුහම්, තලගොයිහම් ලකුණු = 03
iii බෙරයේ රූපසටහන ඇඳීමට ලකුණු = 02
කොටස් හතරක් ලකුණු කිරීම ලකුණු = 03

(5) i උඩරට නර්තන සම්ප්‍රදාය - කොහොඹා කංකාරිය ශාන්තිකර්මය
පහතරට නර්තන සම්ප්‍රදාය - දෙවොල්මඩු ශාන්තිකර්මය
සබරගමු නර්තන සම්ප්‍රදාය - පහන්මඩු ශාන්තිකර්මය ලකුණු = 03

ii කොහොඹාකංකාරි ශාන්තිකර්මයඃ-
යක් ඇනුම, හත්පද, දුනුමාලප්පුව
කොහොඹා හැල්ල, දාන පහ

දෙවොල්මඩු ශාන්තිකර්මය ඃ-
තෙල්මෙ, යහන් දැක්ම, දෙවොල්, පත්තිනි, තොරන් යාගය

පහන්මඩු ශාන්තිකර්මය ඃ-
දේවකෝල්පාඩුව, යහන් දැක්ම, පන්දම් පද, මල්මඩු පරය, හත්පද
ලකුණු = 03

iii සුහදතාව වර්ධනය වීම.
කාර්යය සාර්ථකව කළහැකිවීම.
නායකත්වය දැරීම
නායකත්වයට ගරු කිරීම
සාකච්ඡා මගින් තීරණය ගැනීම.
අන් අයගේ අදහස්වලට ගරු කිරීම.
අන් අයගේ අදහස්වලට සවන්දීම.

කරුණු තුනක් ලියා විස්තර කිරීමට ලකුණු = 03

(6) i ගැමි නැටුමට අදාළ ලක්ෂණ 4 නම් කිරීම ලකුණු = 04

ii කාන්තාවන් සඳහා උචිත ගැමි නැටුම් දෙකක් නම් කිරීම ලකුණු = 02

අදාළ කවි ලිවීම ලකුණු = 02

iii රංගවස්ත්‍රාභරණ කට්ටලයක් සැකසීම පිළිබඳ ලියා ඇත්නම් ලකුණු = 04

(7) i ප්‍රචලිත ප්‍රදේශ :-

දිල්ලිය, ලක්නව්, මහාරාෂ්ඨ, ගුජරාටි, රාජස්ථාන්, ජායිපූර්, බෙනාරිස්

වාද්‍ය භාණ්ඩ :-

තබ්ලාව, සර්පිනාව, බටනලාව, තාම්පුරාව, සිතාරය, සාරංගිය, පක්වාජ්

අධ්‍යාපන ආයතන:-

දිල්ලි කතක් කේන්ද්‍රය

භාත්කණ්ඩ විශ්ව විද්‍යාලය

නර්තන අංග :-

ආමද්, සලාම්, බෝල්, පරන්, චක්‍රධාර්, ගත්, තත්කාර් ලකුණු = 08

ii රංගවස්ත්‍රාභරණ හින්දු හා මුස්ලිම් සංස්කෘතියට අනුව සකස්වී ඇති බව

| කාන්තා රංගවස්ත්‍රාභරණ | පිරිමි රංගවස්ත්‍රාභරණ |
| --- | --- |
| වේලය - දෘපට්ටා | පිජාමා - චූර්ධාර් |
| රැලි සාය - ලෙහෙගා | ගවුම - රෙස්වාජ් |
| හැට්ටය - චෝලි | |
| පාදයට ගුංගුරු | |
| පිජාමා - චූර්ධාර් | |

රංග වස්ත්‍රාභරණ 4 ක් ලියා ඇත්නම් ලකුණු = 04